# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1546/9 - 2008 අප්‍රේල් 22 වැනි අඟහරුවාදා - 2008.04.22

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

**2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත**

2008 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන ) පනතින් අවසන් වරට සංශෝධිත, 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 12 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමා විසින් සාදන ලද නියෝගය.

රංජිත් සියඹලාපිටිය,
*වැඩබලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.*

2008 ක් වූ අප්‍රේල් මස 11 වැනි දින,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය,
කොළඹ 01.

නියෝග

2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වගන්තියට අදාලව සාදන ලදුව, 2007 ජූලි මස 18 වන දිනැති අංක 1506/6 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* සංශෝධිත 2007 ජූනි මස 20 වන දිනැති අංක 1502/10 දරන ගැසට් පත්‍රයෙහි සඳහන් 04 වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීම මගින් තවදුරටත් සංශෝධනය කෙරේ.

"04 යම් වෙළඳාමක හෝ ව්‍යාපාරයක 2008 අප්‍රේල් මස 01 දිනෙන් ආරම්භ වන යම් කාර්තුවක් සඳහා -

(i) යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් පවත්වාගෙන යනු ලබන, නොකැපූ ස්වරූපයෙන් ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද රළු දියමන්ති හෝ මැණික් කපා ඔප දමා ආනයනය කරන වෙළඳාමක හෝ ව්‍යාපාරයක එම කාර්තුව සඳහා රළු දියමන්තිවල මි.ර.ගැ. ( CIF ) වටිනාකම ඉක්මවා එම අපනයනවල නැ. තෙ. නො. (FOB) වටිනාකමේ අතිරික්තය ;

(ii) යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් පවත්වාගෙන යනු ලබන NFE පදනම මත ආනයනය කළ ද්‍රව්‍යවලින් නිපදවන ලද ඇඟලුම් ආනයනය කිරීමේ වෙළඳාමක හෝ ව්‍යාපාරයක එම කාර්තුව සඳහා එවැනි ද්‍රව්‍යයන්ගෙන් මි. ර. ගැ. (CIF) වටිනාකම ඉක්මවන එම අපනයනවල නැ. තෙ. නො. (FOB) වටිනාකමේ අතිරික්තය ;

(iii) යම් තැනැත්තෙකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් පවත්වාගෙන යනු ලබන NFE පදනම මත ආනයනය කරන ලද ද්‍රව්‍යවලින් ශ්‍රී ලංකාවේ නිපදවන ලද ඉහත (ii) ඡේදයෙහි සඳහන් ඇගලුම් හැර වෙනත් භාණ්ඩයක් අපනයනය කිරීමේ වෙළඳාමක හෝ ව්‍යාපාරයක එම කාර්තුව සඳහා එවැනි භාණ්ඩවල මි. ර. ගැ. ( CIF ) වටිනාකම ඉක්මවන එම අපනයනවල නැ. තෙ. නො. ( FOB ) වටිනාකමේ අතිරික්තය ;

(iv) යම් ප්‍රාථමික වෙළෙන්දෙකු විසින් ;

— සුරැකුම්පත් මිලදී ගැනීම සඳහා එම කාර්තුව තුළ ආයෝජිත මුදල ; සහ

එම කාර්තුව තුළ එළඹී යම් ප්‍රති මිලදී ගැනීමේ ගණුදෙනුවකට අදාලව ගෙවූ පොළිය හෝ ලබා දුන් වට්ටම

යන දෙකෙහි එකතුව ඉක්මවන, එම ප්‍රාථමික වෙළෙන්දා සතුව තිබූ සුරැකුම් පත් විකිණීමෙන් ලැබෙන මුදලේ අතිරික්කය ;

එකී වෙළඳාමේ හෝ ව්‍යාපාරයෙහි පිරිවැටුම වන්නේ ය.

එකී පනතේ 2 වගන්තියෙහි (3) උප වගන්තියෙහි පිරිවැටුම නිර්වචනය කිරීමේ දී පිළිවෙලින් (අ) ඡේදයේ හා (ආ) ඡේදයේ නිශ්චිතව සඳහන් කර ඇති අඩු කිරීම් හා එකතු කිරීම් පිළිබඳ නිසි සැලකිල්ල දැක්විය යුතු වේ.”

05 - 79

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.